**කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව - 2022**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.3(ආ) ඡේදයේ නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පෙරටු කාර්යාලයට උපකරණ මිලදී ගැනීම් සඳහා ලැබුණු රු.683,500 ක් පුනරාවර්තන ප්‍රදාන ලෙස ගිණුම් ගතකර තිබුණි. | පිළිගන්නා බව. | ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සඳහන් කළ යුතුය. |
| (ආ) | ටිකිරි හැන්දෑව ජල ව්‍යාපෘතියට මෝටරයක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් දරණ ලද රු.125,700 ක වියදම පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණු අතර ව්‍යාපෘතිය දිර්ඝ කිරීමේ වියදම් රු.831,045 ක් වත්කම් හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම, දේපළ පිරියත උපකරණ ලෙස හඳුනාගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කඩ කුලී ආදායම රු.101,333 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාව ව්‍යාපෘති ආධාර යටතේ ඉදි කළ ව්‍යාපෘතිවල වටිනාකම රු.5,583,877 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) 2022 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය රු.8,489,989 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ එය රු.5,341,080 ක් ලෙස රු.3,148,909 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 07 කට අදාලව සමාලෝචිත වර්ෂයේ වත්කම් හා වගකීම් ප්‍රකාශයේ සඳහන් වටිනාකම රු.105,987,895 ක්වූ අතර ඊට අදාල සටහන් අනුව වටිනාකම රු.96,594,319 ක් වූයෙන් රු.9,393,578 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | ගිණුම් විෂයයන් 03 කට අදාලව 2022 දෙසැම්බර් 31 දිනට මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය රු.20,161,530 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.28,121,422 ක් ලෙස සඳහන් කර තිබීම නිසා රු.7,959,892 ක වෙනසක් විය. | -එම- | -එම- |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයෙහි සඳහන් ශේෂයන් හා ශේෂ පිරික්සුමේ සඳහන් ශේෂයන් අතර රු.12,902,091 ක වෙනසක් විය. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ විස්තිරණ ආදායම් ප්‍රකාශයට අදාළ සටහන් අංක 10 අනුව 2022 ජනවාරි 01 දිනට අතිරික්තයේ (ඌණතාවයේ) හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන රු.52,536,070 ක් වුවත් ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය අනුව එය රු.50,591,759 ක් වූයෙන් රු.1,944,311 ක වෙනසක් විය. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.28,230,286 ක්වූ ආදායම් හා වත්කම් විෂයයන් 04 කට අදාලව ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | පිළිගන්නා බව. | තහවුරු කිරීම ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි පූර්ව කාලපරිච්ඡේදයේ වැරදි ලෙස ගැලපීම් කර ඇති රු.17,687,415 සහ රු.18,981,173 ක ශේෂ සම්බන්ධ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි 1645 | එක් එක් මාසයේ වාහන ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 වර්ෂයේ දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.1,444,662 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.8,156,102 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කල ආදායම් ,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්ත ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 1,136,400 | 1,054,950 | 1,054,950 | - | 1,089,400 | 912,900 | 912,900 | - |
| (ii) | කුළී | 12,599,100 | 10,753,122 | 10,691,032 | 5,929,861 | 8,516,450 | 6,912,515 | 3,668,024 | 5,867,771 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 2,410,603 | 1,241,216 | 832,819 | 593,380 | 2,337,902 | 1,545,341 | 1,455,178 | 184,983 |
| (iv) | වෙනත් ආදායම් | 3,236,970 | 4,318,157 | 3,442,770 | 5,222,225 | 2,812,010 | 1,869,040 | 409,928 | 4,346,838 |
| | | 19,383,073 | 17,367,445 | 16,021,571 | 11,745,466 | 14,755,762 | 11,239,796 | 6,446,030 | 10,399,592 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශවල පිහිටියා වු නිශ්චල දේපළක හෝ නිශ්චල දේපළ වර්ගයක වාර්ෂික වටිනාකම පාදක කරගෙන වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | පනත ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | **කුළී** | | |
| (i) | J.C.B යන්ත්‍රය හා ගල්රෝල කුලියට දීම වෙනුවෙන් වසර 02 ත් 03 ත් අතර කාලයක සිට අයවිය යුතු රු.734,723 ක් විය. | පිළිගන්නා බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සභාව සතු කඩ කාමර වෙනුවෙන් අයකර ගත යුතු රු.1,538,018 ක හිඟකුලී අයකර ගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | සභාව බදුදී තිබුණු වෙළඳ ස්ථාන 15 කින් වසර 01 ත් 08 ත් කාලයක සිට අයවියයුතුව පවතින රු.2,940,809 ක් විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | පුද්ගලයන් 76 දෙනකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු හිඟ ත්‍රීරෝද රථ නැවතුම්පළ ගාස්තු රු.98,400 ක් විය. | -එම- | -එම- |
| (ii) | සභාව විසින් පවත්වාගෙන යනු ලබන යකාවැව ජල ව්‍යාපෘතියට අදාළව අයවිය යුතු හිඟ ජල බිල්පත් හා හිඟ සම්බන්ධතා ගාස්තු රු.200,480ක් විය. | -එම- | -එම- |
| (ඈ) | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,041,340 ක් හා මුද්දර ගාස්තු රු.4,180,833 ක් ලැබී නොතිබුණි. | ගෙන්වා ගැනීමට කටයුතු කරමි. | ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

#### 3.1.1 ගවඝාතකාගාර පවත්වාගෙන යාම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුස්ලිම් ඇටවීරගොල්ලෑව, ඇල්ලවැව යන ප්‍රදේශවල ගව මස් අලෙවිසැල් 02 ක් වාර්ෂික බදුදීම් සිදුකර තිබුණු නමුත් එම මස්හල් සඳහා වන ගෝඝාතකාගාර පහසුකම් සභාව විසින් සම්පාදනය කර නොතිබුණි. | අනුමැතිය ලබාගෙන ඇති බව. | ගෝඝාතකාගාර ආඥා පනත ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 1988 අගෝස්තු 23 දිනැති පොදු සම්මත අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනයේ 32 අතුරු ව්‍යවස්ථාව 09 වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශයේ පරීක්ෂා කරනු ලබන මස් කිලෝ 01 ක් සඳහා රු.10 නොවැඩි ගාස්තුවක් සභාවට අයකරගත යුතු වුවත් මස් පරීක්ෂා කිරීම සහ සභාවේ ලාංඡනය | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |

භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව වෙත ලැබී තිබුණු වාහන 05 ක් වසර 01 ත් 05 ත් අතර කාලයක සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව ගාල්කර තිබුණි. | පිළිගන්නා බව. | අළුත්වැඩියා කර භාවිතයට හෝ අපහරණය කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන 02 ක් අළුත්වැඩියා නොකර වසර 05 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියා කර ඉදිරියේදී භාවිතයට ගනිමි. | භාවිතයට ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නොදිරන කසළ කළමනාකරණය සඳහා සහ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා කිරිකොටුවැව ගව ගෝඝාතාගාරය පිහිටි ඉඩම වෙන්කර ඇතත් එම ඉඩම නිෂ්කාර්යව පැවති අතර ගෝඝාතකාගාරයද භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි. | මේවනවිට මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |